එල්. ඩී. ඕ. 21/2020

# 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. (1) මේ පනත 2024 අංක        දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්තිවල විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්තිවල විධිවිධාන, එකී වගන්ති යටතේ 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතට කරන ලද සංශෝධන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැලසුම් සහ තාක්ෂණික ක්‍රමවේද සකස් කිරීම මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන්නා වූ නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

1968 අංක 32 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:-

"ශ්‍රී ලංකාව සඳහා අනන්‍ය සංඛ්‍යාංක හඳුනාගැනීමේ රාමුව ස්ථාපනය කිරීම පිණිස ද; අනන්‍ය සංඛ්‍යාංක හඳුනාගැනීමේ රාමුවේ ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ලියාපදිංචි කිරීම පිණිස ද; එසේ ලියාපදිංචි කරනු ලබන සුදුසුකම්ලත් පුරවැසියන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම පිණිස ද; නිශ්චිත කාර්ය සඳහා හඳුනාගැනීමේ තොරතුරු සත්‍යාපනය කිරීම, තහවුරු කිරීම සහ හුවමාරු කිරීම පිණිස ද; සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතිවලට පොදු සංශෝධන

3. (1)"ඡායාරූපය" හෝ "ඡායාරූප" යන වචන ප්‍රධාන ප්‍රඥප්තියේ දැක්වෙන සෑම තැනක දී ම, ඒ වචන වෙනුවට, "තැනැත්තකුගේ සංඛ්‍යාංක අනුරූපය" හෝ තැනැත්තකුගේ සංඛ්‍යාංක අනුරූප" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ හෝ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමට අදාළව සාදනු ලැබුවා වූ වෙනත් ලිඛිත නීතියක, යම් දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ඡායාරූපය" හෝ "ඡායාරූප" යන්නට කරනු ලබන යම් සඳහනක්, අවස්ථාවෝචිත පරිදි, "තැනැත්තකුගේ සංඛ්‍යාංක අනුරූපයට" ට හෝ "තැනැත්තකුගේ සංඛ්‍යාංක අනුරූප" යන්නට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"සෑම පුරවැසියකුම ලියාපදිංචි කරනු ලැබිය යුතු බව

2. (1) මේ වගන්තිය ක්‍රියාත්මක වන දින සිට සහ එදිනට පසු, ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තකු ම, 2අ වන වගන්තියේ කාර්යය සඳහා, (මෙහි මින්මතු "කොමසාරිස් ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) 3 වන වගන්තිය යටතේ පත් කරන ලද කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා, වයස අවුරුදු පහළොවට එළඹෙන සෑම පුරවැසියකු ම 9 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය ඇතුළත් කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, එම ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු යː-

"ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුට ම අනන්‍ය සංඛ්‍යාංක

2අ. (1) (අ) 6 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පුරවැසියන් ලියාපදිංචි කරනු ලැබීම

හා සම්බන්ධිත ඉල්ලීම්වලට පහසුකම් සලසන්නා වූ අන්තර් මෙහෙයුම් වේදිකාවක් සහ ජාතික දත්ත හුවමාරු යාන්ත්‍රණයක් හරහා කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) (1) වන උපවගන්තියේ සඳහන් පරිද්දෙන් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුගේම පිළිබඳ තොරතුරු අදාළ නාම ලේඛනයෙහි වාර්තාගත කිරීමෙන්; සහ

(ආ) (මෙහි මින්මතු "අනන්‍ය අංකය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා අනන්‍ය සංඛ්‍යාංක හඳුනාගැනීමේ අංකයක් ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුටම වෙන් කිරීමෙන්,

අවස්ථාවෝචිත පරිදි, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාම ලේඛනයෙහි හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි එකී සෑම පුරවැසියකු ම ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අනන්‍ය අංකයට අදාළ ආකෘතිය සහ විශේෂ අංකන ක්‍රමය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(5) (අ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වන්නේ නම් මිස; හෝ

හඳුනාගැනීමේ අංකයක් වෙන් කළ යුතු බව

සඳහා වන පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාම ලේඛනයෙන්; සහ

(ආ) 6 වන වගන්තියේ (1ආ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පුරවැසියන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා වන පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙන්,

සමන්විත විය යුතු ශ්‍රී ලංකාව සඳහා අනන්‍ය සංඛ්‍යාංක හඳුනාගැනීමේ රාමුව යනුවෙන් හඳුන්වනු ලබන රාමුවක් ස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ පිළිවෙළින් (අ) සහ (ආ) ඡේදවල සඳහන් පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාම ලේඛනයේ සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ ඇතුළත් තොරතුරු -

(අ) එක් එක් නාම ලේඛනයක් සඳහා එක් එක් දත්ත සමුදායක් වෙන් වූ පවතින පරිදි වූ වන දත්ත සමුදායන් ද්විත්වයක විද්‍යුත් ආකෘතියෙන් වාර්තා ගත කළ යුතු ය; සහ

(ආ) (i) පුරවැසියන් හඳුනාගැනීම;

(ii) පුරවැසියන්ගේ අනන්‍යතාව සත්‍යාපනය කිරීම;

(iii) පුරවැසියන්ගේ තොරතුරු තහවුරු කිරීම; සහ

(iv) නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි පුරවැසියන්ට තොරතුරු හුවමාරු කිරීම,

(ආ) යම් තැනැත්තකුගේ ජාතික හැඳුනුම්පත, 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක දී හැර, ඔහුගේ ජාතික හැඳුනුම්පත 47 වන වගන්තිය යටතේ අවලංගු කරනු ලබන්නේ නම් මිස,

පුරවැසියකුට වෙන් කර ඇති අනන්‍යතා අංකය එකී පුරවැසියාගේ ජීවිත කාලයට ම වලංගු විය යුතු වේ.

(6) ශ්‍රී ලාංකික පුරවැසියන්ට අනන්‍යතා අංකය වෙන් කිරීමට අදාළ ක්‍රමය සහ ආකාරය, නියම කරන පරිදි විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1) ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු පිළිබඳ තොරතුරු, (1අ) වන සහ (1ආ) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, අවස්ථාවෝචිත පරිදි, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයෙහි හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයෙහි නියමිත ආකෘතියෙන් සහ නියමිත ආකාරයට වාර්තාගත කරනු ලැබිය යුතු ය.";

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :-

"(1අ) පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයෙහි -

(අ) උපදින අවස්ථාවෙහි දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනට

වයස අවුරුදු පහළොව සම්පූර්ණ නොවූ සෑම තැනැත්තකුම පිළිබඳ;

(ආ) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී හෝ ඊට පෙරාතුව වයස අවුරුදු පහළොව සම්පූර්ණ වූ සහ 9 වන වගන්තිය ප්‍රකාර ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් නොකරන ලද ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු ම පිළිබඳ;

(ඇ) උපතින් පසු යම් අවස්ථාවක ආගමන හා විගමන පාලකවරයා විසින් පුරවැසිභාවය පිළිබඳ වලංගු සහතිකයක් නිකුත් කරනු ලැබ ඇති සහ 9 වන වගන්තිය ප්‍රකාර ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් නොකරන ලද උපතින් හෝ ලියාපදිංචි වීම මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තකු ම පිළිබඳ; සහ

(ඈ) උපදින අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සහ මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී හෝ එදිනට පසු උපත ලද ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තකුම පිළිබඳ,

තොරතුරු ඇතුළත් විය යුතු ය.

(1ආ) පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි -

(අ) මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු ම පිළිබඳ;

(ආ) වයස අවුරුදු පහළොවකට එළඹෙන සහ මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ දී සහ ඉන්පසු 9 වන වගන්තියේ දක්වා ඇති

ආකාරයට ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් කරන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකුම පිළිබඳ,

තොරතුරු ඇතුළත් විය යුතු ය.

(3) එහි (2) වන උපවගන්තියේ (අ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(අඅ) අනන්‍යතා අංකය;";

(4) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :-

"(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) යම් තැනැත්තකු උපදින අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන විට, එකී තැනැත්තා උපන් දින සිට ක්‍රියාත්මක වන පරිදි සහ එකී තැනැත්තා පිළිබඳ නියමිත තොරතුරු නියමිත කාල පරිච්ඡේදය ඇතුළත නියමිත ආකාරයට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබීමෙන් පසු; හෝ

(ආ) යම් තැනැත්තකු පුරවැසිභාවය පිළිබඳ බලපවත්නා නීතිය යටතේ උපතින් හෝ ලියාපදිංචි වීම මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට පත්ව ඇති විට දී, එකී තැනැත්තා ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි සහ එකී තැනැත්තා පිළිබඳ නියමිත තොරතුරු නියමිත කාල පරිච්ඡේදය ඇතුළත නියමිත ආකාරයට ආගමන හා විගමන පාලකවරයාගෙන් ලැබීමෙන් පසු,

පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයෙහි එකී තැනැත්තා ව ලියාපදිංචි කළ යුතු ය. නැතහොත් ලියාපදිංචි කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, 6අ වන වගන්තියේ කාර්ය සඳහා, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනය සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය වෙනස් කිරීම මගින් කලින් කලට, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ තොරතුරු යාවත්කාලීන කිරීම හෝ කිරීම තොරතුරු වෙනස් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"තොරතුරු වෙනස් වීම පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමේ කාර්යය

6අ. 6 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ සෑම පුරවැසියකු විසින් ම -

(අ) අවස්ථාවෝචිත පරිදි, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනය හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනය යාවත්කාලීන කිරීමේ; හෝ

(ආ) 16 වන හෝ 17 වන වගන්තිය යටතේ ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ,

කාර්ය සඳහා නියමිත කාල පරිච්ඡේදය තුළ නියමිත ආකාරයට සහ ආකෘතියෙන් පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ වාර්තාගත කර ඇති එකී පුරවැසියාට අදාළ තොරතුරුවලට බලපාන්නා වූ යම් අවස්ථානුගත වෙනසක් සිදුවුවහොත් ඒ බව කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය;";

(2) එහි (3) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ -

(i) එහි (ii) වන අනුඡේදය ඉවත් කිරීමෙන්; සහ

(ii) එහි (i) වන අනුඡේදය (අ) වන ඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(ආ) එහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ගනු ලබන නියමිත දිග, පළල, පිරිවිතර, ප්‍රමිතිය සහ ගුණාත්මකභාවයෙන් යුතු ඉල්ලුම්කරුගේ සංඛ්‍යාංක අනුරූපය;";

(3) එහි (5) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(5) ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ලිඛිතව ලැබීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා හෝ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් පත්කරන ලද සහතික කිරීමේ නිලධරයා විසින් එම ඉල්ලුම්පත්‍රය නියමිත

ආකෘතියෙන් සහ නියමිත ආකාරයට ලැබුණු බවට දැනුම් දිය යුතු අතර -

(අ) ඉල්ලුම්කරු ඉදිරිපිට සහ ඉල්ලුම්කරුගේ කැමැත්ත ඇතිව පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ කාර්යය සඳහා අවශ්‍ය විට දී, ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු, ඇතුළත් කිරීම, යාවත්කාලීන කිරීම හෝ තොරතුරුවල වෙනස්කම් කිරීම;

(ආ) ඉල්ලුම්කරු විසින් නියමිත ආකෘතියෙන් අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් තහවුරු කර සනාථ කරන ලද, ජාතික හැඳුනුම්පතේ පෙන්නුම් විය යුතු පරිවර්තිත තොරතුරු අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් සහතික කිරීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් නියමිත ආකෘතියෙන් අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් තහවුරු කර සනාථ කරන ලද, පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ කාර්යය සඳහා හසු කරගන්නා ලද ජෛවමිතික දත්ත මෙන්ම ශාරීරික අශක්තතා අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් සහතික කිරීම;

(ඈ) ඉල්ලුම්කරු විසින් නියමිත ආකෘතියෙන් අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් තහවුරු කර සනාථ කරන ලද, පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයේ කාර්යය සඳහා හසු කර ගන්නා ලද ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් සහතික කිරීම;

(ඉ) ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද සියලුම ලේඛන පරිලෝකනය කර

පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙ හි ගබඩා කිරීම; සහ

(ඊ) ලියාපදිංචිය තහවුරු කිරීමට පෙරාතුව ඉල්ලුම්කරු විසින් සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ ඔහු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල සැබෑ බව ස්ථිර කොට තහවුරු කිරීම,

කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) ඉල්ලුම්කරු මේ වන විටත් පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති තැනැත්තකු වේ නම්; හෝ";

(2) එහි (2) වන උපවගන්තියේ "ඉල්ලුම්කරුට ලිඛිතව" සහ "එම ලිඛිත තොරතුරුවල" යන වචන වෙනුවට, පිළිවෙලින්, "ඉල්ලුම්කරුට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව උත්පාදනය වන ලේඛනයක ආකෘතියෙන්" සහ "එම ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනිකව උත්පාදනය වන තොරතුරුවල," යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ලියාපදිංචි තැනැත්තකු බවට පත්වීමෙන් පසු" යන වචන වෙනුවට "පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි ලියාපදිංචි තැනැත්තකු බවට පත්වීමෙන් පසු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (අ) වන ඡේදයේ "නියමිත ආකෘතියෙන් යුක්ත විය යුතු" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි දළ සැලැස්මෙන්, නිර්මිතයෙන් සහ ආකාරයට තිබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම වගන්තියේ (අ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) අනන්‍යතා අංකය දැරිය යුතු ය;";

(4) එම වගන්තියේ (ආ) ඡේදයේ "ඡායාරූප හෝ ප්‍රතිබිම්භය දැරිය යුතු ය" යන වචන වෙනුවට "ඉල්ලුම්කරුගේ සංඛ්‍යාංක අනුරූපය දැරිය යුතු ය". යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි (2) වන උප වගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) ඉල්ලුම්කරු විසින් එම ජාතික හැඳුනුම්පතේ මුල් පිටපත නැතිවීම පිළිබඳව වාර්තා කරනු ලැබූ පොලිස් ස්ථානයේ තොරතුරු පොතේ අදාළ උධෘතයේ සහතික කළ පිටපතක්, සහ

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන අවස්ථාවක දී, 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ගනු ලැබූ නියමිත ජෛවමිතික දත්ත; සහ

(ii) පෙර ගනු ලැබූ ඉල්ලුම්කරුගේ සංඛ්‍යාංක අනුරූපය, නියමිත වලංගු කාල පරිච්ඡේදය තුළ නොවන අවස්ථාවක දී, හෝ එම අනුරූපය ජාතික හැඳුනුම්පත දරන්නාගේ පෙනුමේ පැහැදිලිව ප්‍රකට වන වෙනස්කම්වලට සමාන නොවන අවස්ථාවක දී,

කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් ගනු ලැබූ නියමිත දිග-පළල, පිරිවිතර, ප්‍රමිති සහ ගුණාත්මකභාවයෙන් යුත් ඉල්ලුම්කරුගේ නව සංඛ්‍යාංක අනුරුවක්,

ඇතුළත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපවගන්තියේ (අඅ) වන ඡේදයේ (i) වන අනුඡේදයේ "එම හැඳුනුම්පතේ දෙවන පිටපතක් ලබාදීම සඳහා වූ ගාස්තුව සම්බන්ධයෙන්" යන වචන වෙනුවට "ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් නියම කිරීම සඳහා අමාත්‍යවරයා මෙයින් බලය පවරා ඇති එම හැඳුනුම්පතේ දෙවන පිටපතක් ලබාදීම සඳහා වූ ගාස්තුව සම්බන්ධයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ "හෝ විද්‍යුත් ක්‍රමයකින් අත්සන් කළ යුතු ය; සහ" යන වචන වෙනුවට "හෝ විද්‍යුත් ක්‍රමයකින් අත්සන් කළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) ඒ සමඟ -

(i) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන අවස්ථාවක දී, 9 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ ගනු ලැබූ නියමිත ජෛවමිතික දත්ත; සහ

(ii) පෙර ගනු ලැබූ ඉල්ලුම්කරුගේ සංඛ්‍යාංක අනුරූපය, නියමිත වලංගු කාල පරිච්ඡේදය තුළ නොවන අවස්ථාවක දී, හෝ එම අනුරූපය ජාතික හැඳුනුම්පත දරන්නාගේ පෙනුමේ පැහැදිලිව ප්‍රකට වන

වෙනස්කම්වලට සමාන නොවන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද තැනැත්තකු විසින් ගනු ලැබූ නියමිත දිග-පළල, පිරිවිතර, ප්‍රමිති සහ ගුණාත්මකභාවයෙන් යුත් ඉල්ලුම්කරුගේ නව සංඛ්‍යාංක අනුරුවක්"; සහ

(4) එම උපවගන්තියේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඈ) ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබුවේ යම් ජාතික හැඳුනුම්පතකට අදාළව ද, එම හැඳුනුම්පත ද සමග ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ, (1අ) වන උපවගන්තියේ සහ (2) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "(1) වන සහ (1අ) වන උපවගන්තිවල" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

"(4) (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 39ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) වන ඡේදයේ "එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ සහතික පිටපතක්" යන වචන වෙනුවට "එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතේ සහතික පිටපතක් හෝ එම තැනැත්තාගේ ජාතික

හැඳුනුම්පතේ සඳහන් විස්තර සනාථ කිරීමේ සහතිකයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) වන ඡේදයේ ''තම නිල කාර්ය ඉටුකිරීමේ දී ඔහු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත මේ පනතේ 39ඇ වගන්තියේ කාර්ය සඳහා'' යන වචන හා අංක වෙනුවට "තම නිල කාර්ය ඉටුකිරීමේ දී ඔහු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත හෝ මේ පනතේ 39ඇ වගන්තියේ කාර්ය සඳහා" යන වචන සහ අංක ආදේශ කිරීමෙන්;

(3) එහි (ඇ) වන ඡේදයේ "සත්‍යතාවය සහතික කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "සත්‍යතාවය සහතික කරනු ලැබිය හැකි ය; හෝ" යන වචන අදේශ කිරීමෙන්;

(4) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඈ) ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සහිතව -

(i) රජයේ නිලධරයකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත; හෝ

(ii) නියමිත අධිකාරියක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු,

පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි ගබඩා කර ඇති තොරතුරු හෙළිදරව් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39ඇ වගන්තිය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 39ඇ වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) නැවත අංකනය කරනු ලැබූ (1) වන උපවගන්තියෙහි -

(අ) (ඇ) වන ඡේදයේ, "අනුව ක්‍රියා කිරීමේ කාර්ය සඳහා" යන වචන වෙනුවට "අනුව ක්‍රියාකාරීමේ කාර්ය සඳහා; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් රාජ්‍ය නිලධාරියකු හෝ අධිකාරියක් මගින් පොදු මහජනතාවට සේවාවක් සැලසීමේ කාර්ය සඳහා,";

(3) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු හෙළිදරව් කරන ක්‍රමය සහ ආකාරය නියම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 39ඉ වගන්තිය ප්‍රතියෝජනය කිරීම

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 39ඉ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ ඇතුළත් තොරතුරු ආරක්ෂා කළ යුතු බව සහ එකී නාම ලේඛන වෙත අනවසරයෙන් හෝ ස්වේච්ඡාවෙන් ප්‍රවේශ වීමට දඬුවම් ලැබිය යුතු බව

39ඉ. (1) කොමසාරිස් ජනරාල්වරයා -

(අ) පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනය සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනය පිළිබඳ වගකිව යුතු ය;

(ආ) 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට යටත් ව, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ සහ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ ගබඩා කර ඇති ශ්‍රී ලංකාවේ

පුරවැසියන් පිළිබඳ තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වන අවශ්‍යතාව විශේෂයෙන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ යහපත උදෙසා සෑම කල්හි ම කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත නීතිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අයිතීන් සහ නිදහස සුරක්ෂිත කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින්, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ ඇතුළත් තොරතුරු වෙත ප්‍රවේශ වීමට, එකී තොරතුරුවල වෙනස්කම් කිරීමට, ඒවා පිටපත් කිරීමට හෝ එකී තොරතුරු සම්භාර වශයෙන් මාරු කිරීමට තුන්වන පාර්ශ්වයකට බලය ලබාදීම හෝ අවසර ලබාදීම නොකළ යුතු ය.

(4) කිසිම තැනැත්තකු විසින් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමතය නොමැතිව පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනය හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනය වෙත ප්‍රවේශය ලබාගැනීම හෝ එම නාමලේඛනවල වාර්තාගත කර ඇති ලියාපදිංචි තැනැත්තකුට අදාළ යම් තොරතුරක පිටපත් හෝ උධෘත ලබාගැනීම නොකළ යුතු ය.

(5) කිසිම තැනැත්තකු විසින් මේ පනත යටතේ තම කාර්ය ඉටුකිරීමේ දී එකී තැනැත්තාට දැනගැනීමට ලැබෙන පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ ඇතුළත් වන යම්

තොරතුරක් අයුතු ලෙස වෙනස් කිරීම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ "44 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ" යන වචන සහ අංක වෙනුවට "44 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ" යන වචන සහ අංක ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සඳහා සහ ඒ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ පනත යටතේ සඳහන් හෝ නියම කරනු ලැබිය යුතු වන්නා වූ සියලු කාරණා;

(ආ) මේ පනත මගින් නියෝග සෑදීමට නියම කරනු ලබන හෝ බලය දෙනු ලබන සියලු කාරණා;

(ඇ) යම් ඉල්ලුම්කරුවකු පුද්ගලයන් පිළිබඳ ජාතික නාම ලේඛනයෙහි ලියාපදිංචි කිරීමට සහ එම ඉල්ලුම්කරුට 14 වන, 16 වන හෝ 17 වන වගන්ති යටතේ ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට එම ඉල්ලුම්කරුගේ සංඛ්‍යාංක අනුරූපයක් ලබාගැනීමේ කාර්යය සඳහා ඡායාරූප ගැනීමට අදාළ සියලු කාරණා;

(ඈ) අනන්‍ය අංකයට අදාළ ව්‍යුහය සහ විශේෂ අංකන ක්‍රමය;

(ඉ) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අනන්‍ය අංක වෙන් කිරීමේ ක්‍රමය සහ ආකාරය;

(ඊ) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් සහ ආගමන හා විගමන පාලකවරයාගෙන් තොරතුරු ලබාගන්නා ආකාරය සහ කාලසීමාව;

(උ) අතින් හෝ විද්‍යුත් ක්‍රමයෙන් ඉල්ලුම්කරුවකු පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයෙහි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය;

(ඌ) ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් පසු ඉල්ලුම්පත්‍ර බැහැර කරන ක්‍රමය සහ ආකාරය;

(එ) පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනය හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනය පවත්වාගෙන යාමට අදාළ වන්නා වූ, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයට හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයට තොරතුරු ලබාගැනීම සහ තොරතුරු යාවත්කාලීන කිරීමට අදාළ වන්නා වූ සහ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාළ වන්නා වූ සියලු කාරණා; සහ

(ඒ) 39ආ වන වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු ගාස්තු.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලබේ:-

(1) "ජෛවමිතික දත්ත" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"ජෛවමිතික දත්ත" යන්නෙන්, මුහුණේ අනුරූප, ඇඟිලි සලකුණු දත්ත හෝ ඇසේ තාරා මණ්ඩලය ආශ්‍රිත දත්ත ඇතුළුව යම් ස්වභාවික තැනැත්තකුගේ අනන්‍ය හඳුනාගැනීමකට ඉඩ සලසන හෝ එවැනි හඳුනාගැනීමක් තහවුරු

කරන එකී තැනැත්තාගේ යම් ශාරීරික, කාය විද්‍යාත්මක හෝ චර්යාමය ගති ලක්ෂණ අදහස් වේ;";

(2) "කොමසාරිස් ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ආගමන හා විගමන පාලකවරයා" යන්නෙන්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 4 වන වගන්තිය යටතේ පත්කරන ලද ආගමන හා විගමන පාලකවරයා අදහස් වේ;";

(3) "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"සංඛ්‍යාංක අනුරූපය" යන්නෙන් පරිගණක උපාංගයක් යොදා ගනිමින් යම් වේලාවක දී එකී අංක ම යොදාගනිමින් එකී අනුරූපය ම ප්‍රතිනිර්මාණය කළ හැකි වන සේ සමස්ත අනුරූපය ම අංක මාලාවක් බවට පරිවර්තනය කරනු ලබන්නා වූ එකිනෙක රූප අංශුව සඳහා වෙන් වූ සංඛ්‍යාත්මක අගයක් ඇති රූප අංශු යනුවෙන් හඳුන්වනු ලබන කුඩා තිත්වලින් සැදුණු ජාලකයක් බවට විභේදිත පින්තූරයක් අදහස් වේ;";

(4) "හැඳුනුම්පත" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"අන්තර් මෙහෙයුම් වේදිකාව" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු හඳුනාගැනීමට අදාළ, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුගේ අනන්‍යතාවය සත්‍යාපනය කිරීමට අදාළ සහ ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුගේ අනන්‍යතාව පිළිබඳ තහවුරු

කිරීමට සහ හුවමාරු කිරීමට අදාළ සේවා සපයනු ලබන ව්‍යුහය හා සංවිධානය අදහස් වේ;

"ජාතික දත්ත හුවමාරු කිරීමේ යාන්ත්‍රණය" යන්නෙන්, අන්තර් මෙහෙයුම් වේදිකාව ක්‍රියාත්මක වන්නේ යම් ප්‍රතිපත්ති, යෝජනා ක්‍රම සහ කාර්ය පටිපාටි පදනම් කොටගෙන ද ඒවායෙහි එකතුව අදහස් වේ;

(5) "ලියාපදිංචි කිරීමේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, (110 වන අධිකාරය වූ) උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වේ;".

අනන්‍ය අංකය වෙන් කිරීමට අදාළ විශේෂ විධිවිධාන

20. අවස්ථාවෝචිත පරිදි, පුද්ගලයන් පිළිබඳ ජාතික පෙරටු නාමලේඛනයේ හෝ පුද්ගලයන් පිළිබඳ ජාතික නාමලේඛනයේ තම නම ලියාපදිංචි නොකළ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඉන්පසු ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට පත්වන සෑම තැනැත්තකු විසින් ම, අනන්‍ය අංකයක් වෙන් කිරීමේ කාර්යය සඳහා, නියම කරනු ලැබිය හැකි කාලසීමාව තුළ, කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි විය යුතු ය.

ඉතිරිකිරීම්

21. 9 වන, 14 වන, 16 වන සහ 17 වන වගන්තිවලට කරන ලද සංශෝධන නොතකා, මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඊට පෙර ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් ජාතික හැඳුනුම්පතක්, සියලු කාර්ය සඳහා අඛණ්ඩව වලංගු විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

22. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

L.D.O. 21/2020

AN ACT TO AMEND THE REGISTRATION OF PERSONS ACT, NO. 32 OF 1968

BE it enacted by the Parliament of the Democratic Socialist Republic of Sri Lanka as follows: -

Short title and date of operation

1. (1) This Act may be cited as the Registration of Persons (Amendment) Act, No. of 2024.

(2) The provisions of this Act other than the provisions of sections 3, 4, 5, 6, 7, 8, 9, 10, 11 and 12 shall come into operation on the date on which the Bill becomes an Act of Parliament.

(3) The provisions of sections 3, 4, 5, 6, 7, 8, 9, 10, 11 and 12 shall come into operation on such date as the Minister may appoint by Order published in the *Gazette* upon the necessary infrastructure arrangements and technological methodologies are made to give effect to the amendments made under those sections to the provisions of the Registration of Persons Act, No.32 of 1968.

Replacement of the long title to Act No. 32 of 1968

2. The long title of the Registration of Persons Act, No.32 of 1968 (hereinafter referred to as the "principal enactment") is hereby repealed and the following long title substituted therefor: -

"AN ACT TO PROVIDE FOR THE ESTABLISHMENT OF THE UNIQUE DIGITAL IDENTITY FRAMEWORK FOR SRI LANKA; FOR THE REGISTRATION OF ALL CITIZENS OF SRI LANKA IN THE UNIQUE DIGITAL IDENTITY FRAMEWORK; FOR THE ISSUANCE OF NATIONAL IDENTITY CARDS TO THE ELIGIBLE CITIZENS SO REGISTERED; FOR THE AUTHENTICATION, VERIFICATION AND SHARING OF IDENTITY INFORMATION FOR SPECIFIED PURPOSES; AND FOR MATTERS CONNECTED THEREWITH OR INCIDENTAL THERETO.".

General amendments to the principal enactment and other written law

3. (1) In the principal enactment there shall be substituted for the word "photograph" or "photographs", of the words the "digital image of a person" or "digital images of a person", wherever those words appear in the principal enactment.

(2) Any reference to "photograph" or "photographs", in other written law, any, notice, notification or other document, made under the principal

enactment or in relation to registration of persons under the provisions of the principal enactment, shall be read and construed as a reference to "digital image of a person" or "digital images of a person", as the case may be.

Replacement of section 2 of the principal enactment

4. Section 2 of the principal enactment is hereby repealed and the following section is substituted therefor: -

"Every citizen to be registered

2. (1) From and after the date of coming into operation of this section, every person who is a citizen of Sri Lanka shall be registered by the Commissioner-General appointed under section 3 (hereinafter referred to as the "Commissioner General"), for the purpose of section 2A.

(2) Every citizen who attains the age of fifteen years shall be liable to apply for registration in the manner set out in section 9 for the issue of a National Identity Card under this Act.".

Insertion of section 2Ain the principal enactment

5. The following new section is hereby inserted immediately after section 2 of the principal enactment and shall have effect as section 2A of that enactment: -

"Every citizen of Sri Lanka to be assigned a Unique Digital Identification Number

2A. (1) There shall be established a framework called the Unique Digital Identity Framework for Sri Lanka, which shall comprise of the -

(a) National Pre-Register of Persons in which the citizens specified in subsection (1A) of section 6 are registered; and

(b)National Register of Persons in which the citizens specified in subsection (1B) of section 6 are registered.

(2) The information contained in the National

Pre-Register of Persons and the National Register of Persons referred to in paragraphs (a) and (b) of subsection (1) respectively, shall be-

(a) recorded in the electronic form in two databases, each reserved for each such register; and

(b) managed through an Inter-operability Platform and a National Data Exchange Mechanism, through which requests relating to the-

(i) identification of citizens;
(ii) authentication of citizen's identity;
(iii) verification of citizen's information; and
(iv) sharing of citizens' information as provided for by law,

shall be facilitated.

(3) The Commissioner-General shall register every citizen of Sri Lanka in the National Pre-Register of Persons or in the National Register of Persons, as the case may be by-

(a) recording information of such citizen in the relevant register as referred to in subsection (1); and

(b) assigning a Sri Lanka Unique Digital Identification number (hereinafter referred to as the "SL-UDI number") to every such citizen.

(4) The Minister, by Order published in the *Gazette,* shall specify the structure and distinctive numbering regime relating to the SL-UDI number.

(5) The SL-UDI number assigned to a citizen shall be valid for the lifetime of such citizen unless-

(a) such person ceases to be a citizen of Sri Lanka; or

(b) the national identity card of such person is invalidated under section 47, except where such card has been invalidated under paragraph (b) of subsection (1) of section 18.

(6) The mode and manner relating to the assignment of SL-UDI numbers to citizens of Sri Lanka shall be as prescribed.".

Amendment of section 6 of the principal enactment

6. Section 6 of the principal enactment is hereby amended as follows: -

(1) by the repeal of subsection (1) thereof and the substitution therefor, of the following: -

"(1) The information relating to every citizen of Sri Lanka shall be recorded, subject to the provisions of subsection (1A) and (1B), in the National Pre- Register of Persons or National Register of Persons, as the case may be, in the prescribed form and manner.";

(2) by the insertion immediately after subsection (1) of that section of the following new subsections:-

"(1A) The National Pre- Register of Persons shall include the information of-

(a) every person who is a citizen of Sri Lanka at the time of birth and has not attained the age of fifteen years on the date of coming into operation of this section;

(b) every citizen of Sri Lanka who has attained the age of fifteen years on or prior to the date of coming into operation of this section and has not applied for registration in terms of section 9;

(c) every citizen of Sri Lanka by decent or by registration who has been issued with a valid certificate of citizenship by the Controller of Immigration and Emigration, at any time after birth, and has not applied for registration in terms of section 9; and

(d) every person who is a citizen of Sri Lanka at the time of birth and born on or after the date of coming into operation of this section.

(1B) The National Register of Persons shall include the information of every citizen of Sri Lanka-

(a) who has been registered in the National Register of Persons prior to the date of coming into operation of this section;

(b) who attains the age of fifteen years and applies for registration in the manner set out in section 9 on and after the date of coming into operation of this section.";

(3) in subsection (2) thereof, by the insertion immediately after paragraph (a), the following new paragraph: -

"(aa) the SL-UDI number;";

(4) by the addition, immediately after subsection (2) thereof, the following new subsections:–

"(3) The Commissioner-General shall register or cause to be registered a person in the National Pre-Register of Persons –

(a) where such person is a citizen of Sri Lanka at

the time of birth, with effect from the date of birth of such person and upon the receipt of prescribed information of such person from the Registrar-General within a prescribed period in the prescribed manner; or

(b) where such person has become a citizen of Sri Lanka by decent or by registration under the law in force relating to citizenship, with effect from the date of registration of such person as a citizen of Sri Lanka and upon the receipt of prescribed information of such person from the Controller of Immigration and Emigration within a prescribed period in a prescribed manner.

(5) The Commissioner-General shall update and modify the information either in the in the National Pre-Register of Persons or in the National Register of Persons from time to time by modifying the National Pre-register of Persons and the National Register of Persons, for the purposes of section 6A.".

Replacement of section 6A of the principal enactment

7. Section 6A of the principal enactment is hereby repealed and the following section is substituted therefor: -

"Duty to inform the Commissioner-General of change of information

6A. Every citizen registered under section 6 shall inform the Commissioner-General of any change of circumstances affecting the information relating to such citizen recorded either in the National Pre-Register of Persons or the National Register of Persons, in the prescribed manner and form within a prescribed period for the purpose of-

(a) updating the National Pre-Register of Persons or the National Register of Persons, as the case may be; or

(b) issuance of a National Identity Card under section 16 or 17.".

Amendment of section 9 of the principal enactment

8. Section 9 of the principal enactment is hereby amended as follows: -

(1) in subsection (2) thereof, by the repeal of paragraph (a) of that section and the substitution therefor of the following paragraph: -

"(a) shall be made in writing;";

(2) in subsection (3) thereof -

(a) in paragraph (a) of that section-

(i) by the repeal of subparagraph (ii) thereof; and

(ii) by the renumbering of subparagraph (i) as paragraph (a) thereof; and

(b) by the repeal of paragraph (b) thereof and the substitution therefor of the following paragraph: -

"(b) the digital image of the applicant of prescribed dimensions, specifications, standards and quality taken by the Commissioner-General or by a person authorized by the Commissioner-General;";

(3) by the repeal of subsection (5) thereof and the substitution therefor, of the following: -

"(5) Upon the receipt of an application for registration in writing, the Commissioner-General or a Certifying Officer appointed by the Commissioner-General under subsection (2) of section 3 shall acknowledge the receipt of such application in the prescribed form and manner and shall-

(a) enter, update or modify, where necessary, the information relating to the applicant for the purpose of National Register of Persons in the

presence and with the consent of the applicant;

(b) certify manually or electronically the transliterated information to be appeared on National Identity Card, which are verified and confirmed manually or electronically by the applicant in the prescribed form;

(c) certify manually or electronically the captured biometrics as well as infirmities for the purpose of National Register of Persons, which are verified and confirmed manually or electronically by the applicant in the prescribed form;

(d) certify manually or electronically the captured information relating to the applicant for the purpose of National Register of Persons, which are verified and confirmed manually or electronically by the applicant in the prescribed form;

(e) scan and store all documents submitted by the applicant in the National Register of Persons; and

(f) validate and verify from the relevant authorities the accuracy of information provided and the genuineness of documents submitted by the applicant prior to confirmation of registration.".

Amendment of section 10 of the principal enactment

9. Section 10 of the principal enactment is hereby amended as follows: -

(1) in subsection (1) thereof, by the repeal of paragraph (c) of that subsection and the substitution therefor, of the following: -

"(c) if the applicant is a person already registered in the National Register of Persons; or";

(2) in subsection (2) thereof, by the substitution for the words "applicant in writing", and "such written information", of the words, "applicant in writing or in the form of an electronically-generated document" and "such written or electronically-

generated information", respectively.

Amendment of section 14 of the principal enactment

10. Section 14 of the principal enactment is hereby amended as follows: -

(1) by the substitution for the words "becomes a registered person", of the words "becomes a person registered in the National Register of Persons";

(2) in paragraph (a) of that section, by the substitution for the words "shall be in the prescribed form", of the words "shall be in the layout, design and manner as may be specified by the Minister by Order published in the *Gazette*";

(3) by the insertion immediately after paragraph (a) of that section, of the following new paragraph: -

"(aa) shall bear the SL-UDI number;";

(4) in paragraph (b) of that section by the substitution for the words "shall bear the photograph or the image", of the words "shall bear the digital image of the applicant".

Amendment of section 16 of the principal enactment

11. Section 16 of the principal enactment is hereby amended by the repeal of paragraph (d) of subsection (2) of that section and the substitution therefor, of the following: -

"(d) shall contain a certified copy of the relevant extract of the information book of the police station to which the loss of the original of such national identity card was reported by the applicant, and-

(i) where the Commissioner-General requires, prescribed biometrics of the applicant taken under paragraph (a) of subsection (3) of section 9; and

(ii) where the digital image of the applicant previously taken is not within the prescribed period of validity or does not resemble visible changes in the appearance of the holder of the national identity card, a fresh digital image of the applicant in the prescribed dimensions,

specifications, standards and quality taken by the Commissioner-General or by a person authorized by the Commissioner-General.".

Amendment of section 17 of the principal enactment

12. Section 17 of the principal enactment is hereby amended in subsection (2) thereof as follows: -

(1) in sub-paragraph (i) of paragraph (aa) of that subsection, by the substitution for the words, "the fee for the issue of a duplicate of such card" of the words "the fee for the issue of a duplicate of such card, which the Minister is hereby authorized to fix by notification published in the *Gazette*";

(2) in paragraph (b) of that subsection, by the substitution for the words "or electronically; and" of the words "or electronically;";

(3) by the repeal of paragraph (c) of that subsection (2), and the substitution therefor, of the following: -

"(c) shall contain-

(i) where the Commissioner-General requires, prescribed biometrics of the applicant taken under paragraph (a) of subsection (3) of section 9;

(ii) where the digital image of the applicant previously taken is not within the prescribed period of validity or does not resemble visible changes in the appearance of the holder of the national identity card, a fresh digital image of the applicant in the prescribed dimensions, specifications, standards and quality taken by the Commissioner-General or by a person authorized by the Commissioner-General; and

(4) by the addition, immediately after paragraph (c) of that subsection, of the following new paragraph: -

"(d) shall be accompanied by the national identity card in respect of which the application is made.".

Amendment of section 22 of the principal enactment

13. Section 22 of the principal enactment is hereby amended as follows: -

(1) in subsection (3) thereof, by the substitution for the words, "subsections (1),(1A) and (2)" of the words, "subsections (1) and (1A)"; and

(2) by the addition, immediately after subsection (3) thereof, of the following new subsection: -

"(4) Any person who contravenes the provisions of subsection (2) shall be guilty of an offence and shall, on conviction be liable to a fine not exceeding five thousand rupees.".

Amendment of section 39B of the principal enactment

14. Section 39B of the principal enactment is hereby amended as follows: -

(1) in paragraph (a) thereof, by the substitution for the words, "a certified copy of the national identity card of that person" of the words, "a certified copy of the national identity card of that person or a certificate of confirmation of particulars in the national identity card of that person";

(2) in paragraph (b) thereof, by the substitution for the words, "duties or for the purposes" of the words, "duties or for the purposes";

(3) in paragraph (c) thereof, by the substitution for the words, "upon a written request made by a prescribed authority" of the words, "upon a written request made by a prescribed authority and on payment of a prescribed fee by such prescribed authority; or";

(4) by the addition, immediately after paragraph (c) thereof, of the following new paragraph: -

"(d) with the consent of the holder of a national identity card, disclose information stored in the National

Register of Persons, -

(i) upon a written request made by a public officer; or

(ii) upon a written request made by a prescribed authority and on payment of a prescribed fee,

where such disclosure is necessary for the purpose of providing services to such holder of national identity card.".

Amendment of section 39C of the principal enactment

15. Section 39C of the principal enactment is hereby amended as follows:-

(1) by the re-numbering of that section as subsection (1);

(2) in the re-numbered subsection (1)-

(a) in paragraph (c), by the substitution for the words "issued by a competent Court." of the words "issued by a competent Court; or"; and

(b) by the addition, immediately after paragraph (c) thereof, of the following new paragraph: -

"(d) for the purposes of providing services to the general public by such public officer or authority.";

(3) by the addition, immediately after subsection (1), the following new subsection:-

"(2) The mode and manner of disclosing information under subsection (1) shall be prescribed.".

Replacement of section 39E of the principal enactment

16. Section 39E of the principal enactment is hereby repealed and the following section is substituted therefor: -

Information

39E. (1) The Commissioner-General

contained in the in the National Pre-Register of Persons and the National Register of Persons to be protected and unauthorized or unsolicited access to such registers to be penalized

shall-

(a) be responsible for the National Pre-Register of Persons and the National Register of Persons;

(b) subject to the provisions of the Personal Data Protection Act, No. 09 of 2022 and the Right to Information Act, No. 12 of 2016 act, at all times, in the interest of the citizens of Sri Lanka, having particular regard to the need for the protection of information relating to the citizens of Sri Lanka stored in the National Pre-Register of Persons and the National Register of Persons.

(2) The Commissioner-General shall take all necessary measures to safeguard the rights and the freedoms of a citizen of Sri Lanka under written law.

(3) The Commissioner-General shall not, authorize or permit a third party, to access, modify, copy information contained in the National Pre-Register of Persons and in the National Register of Persons or transfer such information in bulk form.

(4) No person shall, without the approval of the Commissioner-General gain access to the National Pre-Register of Persons or the National Register of Persons, or make copies or extracts of any information, recorded in any such register, relating to a registered person.

(5) No person shall, tamper with any information containing in the National Pre-

Register of Persons or in the National Register of Persons, which may come to his knowledge in the performance of his duties under this Act.

Amendment of section 51 of the principal enactment

17. Section 51 of the principal enactment is hereby amended by the substitution for the words **and figures**, "under subsection (1) of section 44" of the words **and figures**, "under subsection (1) of section 44 and subsection (4) of section 22".

Amendment of section 52 of the principal enactment

18. Section 52 of the principal enactment is hereby amended by the repeal of subsection (2) of that section and the substitution therefor, of the following: -

"(2) Without prejudice to the generality of powers conferred by subsection (1), the Minister may make regulations for and in respect of the following matters: -

(a) all matters stated or required to be prescribed under this Act;

(b) all matters for which regulations are required or authorized by this Act to be made;

(c) all matters relating to the taking of photographs for the purpose of obtaining a digital image of an applicant to register such applicant in the National Register of Persons and to issue to such applicant a national identity card under sections 14, 16 or 17;

(d) structure and the distinctive numbering regime relating to the SL-UDI number;

(e) mode and manner of assigning SL-UDI numbers to citizens of Sri Lanka;

(f) the manner and period of obtaining information from the Registrar General and the Controller of Immigration and Emigration;

(g) the process of registering an applicant in the National Register of Persons manually or electronically and the format of the application;

(h) the mode and manner of disposing applications after issuing the national identity cards;

(i) all matters relating to the maintenance of the National Pre-Register of Persons or the National Register of Persons, obtaining, updating and disclosing of information in the National Pre-Register of Persons or in the National Register of Persons and the issuance of national identity cards; and

(j) the fees to be charged under section 39B ".

Amendment of section 55 of the principal enactment

19. Section 55 of the principal enactment is hereby amended as follows: -

(1) by the repeal of the definition of expression, "biometrics" and the substitution therefor, of the following definition of expression.

"biometrics" means any physical, physiological, or behavioral characteristics of a natural person, which allow or confirm the unique identification of that natural person, including facial images, dactyloscopic data or iris related data;";

(2) by the insertion immediately after definition of expression "Commissioner-General", the following new definition: -

"Controller of Immigration and Emigration" means the Controller of Immigration and Emigration appointed under section 4 of the Immigrants and Emigrants Act (Chapter 351);";

(3) by the insertion immediately after definition of expression "Deputy Commissioner", the following new definition: -

"digital image" means a picture divided into a grid made of small dots called pixels, each of which has an assigned numerical value, translating the entire image into a string of numbers that enables to recreate the same image using the same numbers at any time using a computing device.;";

(4) by the insertion immediately after definition of expression "identity card", the following new definitions: -

"Inter-operability Platform" means a structure and organization, through which services relating to the identification of any citizen of Sri Lanka, authentication of identity of any citizen of Sri Lanka and verification and sharing of identity-related information of any citizen of Sri Lanka are provided;

"National Data Exchange Mechanism" means the collection of policies, schemes, and procedures, based on which the Inter-operability Platform operates;

(5) by the insertion immediately after definition of expression "Registration Officer", the following new definition: -

"Registrar-General" means the Registrar-General of Births and Deaths appointed under section 2 of the Births and Deaths Registration Act (Chapter 110);".

Special provisions relating to the assignment of SL-UDI.

20. Every person who is or becomes a citizen of Sri Lanka on or after the date of commencement of this Act, whose name is not registered in the National Pre-Register of Persons or the National Register of Persons, as the case may be, shall, for the purpose of assigning a SL-UDI number, register with the Commissioner-General within the period as may be prescribed.

savings

21. Notwithstanding the amendments made to sections 9, 14, 16 and 17, any national identity card issued under the provisions of the principal enactment on or before the date of coming into operation of this Act, shall continue to be valid for all purposes.

Sinhala text to prevail in case of inconsistency

22. In the event of any inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text shall prevail.